කොළඹ විශ්වවිද්‍යාලය
ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය
දෙවන සෙමෙස්තරය 2016/2017

# FND 1212 – සිංහල ලේඛන සම්ප්‍රදාය හා සන්නිවේදනය

(පැ දෙකයි)

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

1. අමාවතුර හා බුත්සරණ යන සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථවල භාෂා රීතියේ සමවිසමතා සමාලෝචනය කරන්න.

2. "සද්ධර්මරත්නාවලී කතුවරයා ස්වාධීන රචනා ශෛලියක් අනුගමනය කළ ලේඛකයෙකි" මේ අදහසට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

3. මහනුවර යුගයේ දී සිංහල ලේඛන සම්ප්‍රදායේ කැපී පෙනුණු ලක්ෂණ විභාග කරන්න.

4. "නූතන සිංහල ලේඛන ව්‍යවහාරයේ රීති විවිධත්වයක් දැකිය හැකි ය" නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

5. හුදු හෙළ හා මිශ්‍ර සිංහල ලේඛන ශෛලීන් අතර පවත්නා වෙනස්කම් විභාග කරන්න.

6. සිංහල ලේඛන සම්ප්‍රදාය අරබයා මාර්ටින් වික්‍රමසිංහ පළ කළ අදහස් සමාලෝචනය කරන්න.

7. සිංහල ලේඛනය විවිධ අවශ්‍යතා සඳහා යොදා ගැනීමේ දී දැකිය හැකි ලේඛන ප්‍රභේද පිළිබඳ විමසීමක් කරන්න.

8. පහත සඳහන් මාතෘකා ඇසුරින් **තුනක් (03)** පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   i. පූජාවලී භාෂා රීතිය
   ii. රීතිය හා ශෛලිය
   iii. පුවත්පත් බස් වහර
   iv. සිංහල පද්‍ය සම්ප්‍රදාය
   v. අජිත් තිලකසේනගේ 'මැදි වහර'

********************